දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280
ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 )0112692913
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail )postmaster@health.gov.lk
වෙබ්අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය / எனது இல / My No. ) NA/03/MS/01/2018
ඔබේඅංකය / உமது இல / Your No. : )
දිනය / திகதி / Date ) 2019.01.04

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල්/ මහ රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත,

**1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2018**

1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ සිටින නිලධාරීන්ගේ ස්ථාන මාරු ලබා දීමට අදාලව නිකුත් කරන ලද පොදු චක්‍ර ලේඛ අංක 01-25/2018 හා 2018.05.18 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද 1 ශ්‍රේණියේ හෙද නිලධාරීන් අතුරින් ස්ථාන මාරු අනුමත වී ඇති නිලධාරීන්ගේ සහ අනුමත නොවූ නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාමලේඛනය මේ සමඟ වේ.

03. 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ වැඩ භාරගත් දිනය අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව නිර්දේශ ලබා දී ඇත. එකම දින 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් වී එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන් සිටියහොත් ඔවුන් පශ්චාද් ප්‍රාථමික හෙද විද්‍යාල තුල හදාරන ලද වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවේ අවසන් විභාගයේදී ලබා ගත් කුසලතාවය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස්කරන ලද බව සැලකිය යුතුය.

04. මෙම ස්ථාන මාරු ලේඛනය සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා සහ නිවැරදි කිරීම් පවතී නම් එම විරෝධතා / නිවැරදි කිරීම් සහ අභියාචනා පහත ලිපිනයට / ෆැක්ස් අංක වලට 2019.01.11 දිනට පෙර දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

වී.සී.ද සිල්වා
අධ්‍යක්ෂ (පාලන) 01
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

ෆැක්ස් අංක - 0112675150 /0112674967

05. අදාල විරෝධතා හා අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව අවසන් ලේඛනය සකස්කරන බැවින් මෙම ලේඛනය අවසාන ලේඛනය නොවන බව කාරුණිකව සලකන්න.

06. අවසන් ලේඛනය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.health.gov.lk) පල කරනු ලබන අතර, විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියෙකුට දැනුම් දෙනු නොලැබේ.

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය